ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC Smart Investor ගිණුම				
නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම**	**ප්‍රධාන නියම හා කොන්දේසි**
විශේෂ ආයෝජන යෝජනාක්‍රමය	• පොලී අනුපාතය නවතම පොලී අනුපාතය සඳහා https://www.boc.lk/personalbanking/investmentplans/investmentaccounts/smart-investor වෙත පිවිසෙන්න. නිශ්චිත කාලසීමාවක් සඳහා වන මාසික තැන්පතු සැලැස්මෙන් අපේක්ෂිත මුදල ගිණුම කල්පිරෙන දිනයේදී ලබාගත හැකිය. ස්වකීය ආදායමට සහ අපේක්ෂාවන්ට අනුව තමන් කැමති විකල්පයක් තෝරාගැනීමේ හැකියාව ගනුදෙනුකරු සතුවීම. මුදල් තැන්පත්කිරීමට අන්තර්ජාල බැංකුකරණ පහසුකම තැන්පතු හා ශේෂයන් බලාගැනීමට Smart පාස්පොත් පහසුකම	• **ආරම්භක තැන්පතුව** - https://www.boc.lk/personal-banking/investmentplans/investment-accounts/smart-investor වෙත පිවිසෙන්න. • **ගිණුම වසාදැමීමේ ගාස්තු** • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** - සහතිකයේ අනු පිටපත නිකුත්කිරීම - ගිණුම් ශේෂයන් තහවුරුකිරීම - ස්ථාවර නියෝග ලියාපදිංචිය සහ මුදල් හුවමාරුකිරීම් - අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු • ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත පිවිසෙන්න. • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	• වයස අවු. 18ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසිකයන්ට මෙම ගිණුම විවෘත කළ හැකිය. • තනි පුද්ගල හෝ බද්ධ ගිණුම් විවෘත කළ හැකිය. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, BOC Smart Investor ගිණුමක් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	- මාසික වාරික ගෙවීම පැහැරහැරීමක්/ ප්‍රමාදවීමක් කල්පිරීමේදී අඩු මුදලක් ලැබීමට හේතුවේ. - "කල්පිරෙන දිනයට පෙරාතුව" තැන්පතු මුදලින් කොටසක්/ සම්පූර්ණ මුදල ආපසුගැනීම සිදුකළ නොහැක. එවැනි අවස්ථාවකදී, ගිණුම වසාදැමීම හෝ සාමාන්‍ය ඉතුරුම් ගිණුමකට මාරුකිරීම සිදුකරනු ලැබේ. - Smart Investor ගිණුම් අලුත්වීමක් සිදුනොවන අතර කල්පිරෙන කාලසීමාව අවසානයේදී, මුදල් ආපසුගන්නා තෙක් පවත්නා ඉතුරුම් පොලී අනුපාතය අදාළ වේ. - මාසික වාරික තුනක් අඛණ්ඩව හෝ කඩින් කඩ නොගෙවුවහොත්, ආයෝජන සැලැස්ම නතරකිරීමේ අයිතිය බැංකුව සතු වන අතර, ගිණුම්හිමියාට පූර්ව දැනුම්දීමකින් තොරව එය සාමාන්‍ය ඉතුරුම් ගිණුමකට හරවනු ලැබේ. එම ගිණුමට අදාළ පොලී අනුපාතය බැංකුවේ අභිමතය අනුව තීරණය වේ. - නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.

අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk
- තැපෑල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.